
# මම ආසයි ඉගෙනගන්න...




**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

1 ශ්‍රේණිය ඒ

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

# මම ආසයි ඉගෙනගන්න...




## පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර

1 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

කෘතියේ නම : මම ආසයි ඉගෙනගන්න...

ප්‍රථම මුද්‍රණය : 2023.11.15

කතාව සහ චිත්‍ර : පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර

කතෘගේ ලිපිනය : අංක: 46/2, පිළවල, ගුන්නෑපාන.

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

ශ්‍රේණිය : 1 ශ්‍රේණිය A

ISBN අංකය : ISBN 978-624-208-086-4

පරිගණක අක්ෂර, පිටු සැකසුම හා වර්ණ ගැන්වීම්
අධීක්ෂණය : සංඛ පද්ම බණ්ඩාර

කතෘගේ අනෙකුත් කෘති

- කිටියාට පාඩමක්...
- කැළෑ ගමේ ගිනි නිවන හමුදාව
- පාට පාට පාට ලෝකේ...
- Rainbow Fairy

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# පිදුම

පෙර පාසලේ ගුරුතුමියන්ට

මගේ පාසලේ ඇදුරුතුමියන්ට

මගේ පාසලේ සොහොයුරියන්ට

මගේ අම්මාට, අප්පච්චීට, මල්ලීට, අත්තාට,

සහ

අත්තම්මාට

බැතියෙන් පුදමි.

# හැඳින්වීම

මෙම පොත "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය යටතේ මහාමායා බාලිකා විද්‍යාලයේ 1 ශ්‍රේණිය ඒ පංතියේ පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර ශිෂ්‍යාව විසින් නිර්මාණය කළ කතාවක් හා චිත්‍ර ඇතුළත් පොතකි.

# ස්තූතිය

පොත් ලිවීමට මහඟු අවස්ථාවක් හා පරිසරයක්

තනා දුන්

මගේ පංතිභාර ගුරුතුමිය වන දමයන්ති රත්නායක ගුරු මෑණියන්ටත්,

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියේ සම්භන්ධීකාරක තුමිය වන
සමන්මලී ගුරු මෑණියන්ටත්,

එම ව්‍යාපෘතියේ නිර්මාපක

සෙනවිරත්න මහලේකම්ගේ ගුරු පියාණන්ටත්

ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත්

අප විද්‍යාලයේ විදුහල්පතිතුමියටත්

ISBN කේත ලබාගැනීම සඳහා නොමඳ සහයක් ලබා දුන්

4 ශ්‍රේණියේ සතිනි දියණියගේ මව වන


ලුම්බිණි මහත්මියටත්

ආදරණීය අප්පච්චීටත්, අම්මාටත් සහ

මල්ලීට

මගේ හද පිරි ස්තූතිය පිරිනමමි.

ඔන්න, පෙන්ගුයින් අම්මා බිත්තරයක් දැම්මා.



කාලය ගතවුණා, ඔන්න, දැන් පෙන්ගුයින් පැටියා, බිත්තරෙන් එළියට ආවා.



එයා අලුත් අලුත් දේවල් ඉගෙනගන්න හරි ම ආසයි.


එයා එයාගේ සීත හිම කඳු අතරේ තියන ගමේ ඇවිදලා බැලුවා. එහේ ඉන්න අයත් එක්ක බය නැතුව කතා කළා.



එයාට ගොඩාක් දේවල් ඉගෙනගන්න තියනවා කියලා එයා දැනගත්තා. ඒත් ඒවා ඉගෙනගන්න යන්න කලින් එයා එයාගේ අම්මාගෙනුයි, තාත්තාගෙනුයි, අවසර ගත්තා. එයා හරි ම හොඳ පෙන්ගුයින් පැටියෙක් නේද?




ඔන්න, එයා ඇවිදගෙන ගියා. එයාට මුලින් ම හමුවුණේ, සීල් කෙනෙක්, එයා පෙන්ගුයින් පැටියාට මාළු බාන්න කියලා දුන්නා. මාළු බාන්න හොඳට ඉගෙනගත්තා, පෙන්ගුයින් පැටියා සීල්ට ස්තුති කරලා ඉස්සරහට ඇවිදගෙන ගියා.




ඊ ළඟට, එයාට හමුවුණේ තරුණ පෙන්ගුයින් කෙනෙක්. එයා පෙන්ගුයින් පැටියාට, හිම උඩ ලිස්සලා යන්න කියලා දුන්නා. එයාටත් ස්තුති කරපු පෙන්ගුයින් පැටියා ආයෙත් ඇවිදගෙන ගියා තවත් දේවල් ඉගෙනගන්න ආසාවෙන්.



ඔන්න, එයාට මේ පාර හමුවුණේ හිම වලහෙක්. එයා බයත් වුණා. එයා ඒත්, බය පෙන්නන්නේ, නැතුව හිම වලහාට කතා කළා. හිම වලහා, පෙන්ගුයින් පැටියාට මුහුද උඩ මිදුණු හිම වල වළවල් හාරලා, එවායින් ඇතුළට යන්න කියලා දුන්නා. ඒකත් ඉගෙනගත්ත, පෙන්ගුයින් පැටියා හිම වලහාටත් ස්තුති කළා. ඊට පස්සේ, ආයෙත් ඇවිදගෙන යන්න පටන් ගත්තා,



මේ පාර එයාට හමුවුණේ එස්කිමෝවරයෙක්. එයා අයිස් කුට්ටි වලින් ඉග්ලූ ගෙයක් හදනවා. පෙන්ගුයින් පැටියා, එයාට කතා කරලා ඒ ගැන ඇහුවා, එස්කිමෝ එයාට ඉග්ලූ ගෙවල් හදන හැටි කියලා දුන්නා. දැන් පෙන්ගුයින් පැටියා ගොඩක් දේවල් දන්නවා. කාලය ගෙවිලා ගියා නොදැනීම.




ඔන්න දැන්, පෙන්ගුයින් පැටියා ලෑස්ති, ගෙදර යන්න. එයා ලෑස්තිවෙලා මූණ බලන්න ගියා, හිමේ තිබුණ වතුර වළක් ගාවට. එයාටම පුදුමයි, එයා දැන් ලොකු තරුණ පෙන්ගුයින් කෙනෙක්.



මටත් හරි පුදුමයි...

අපේ අම්මයි අප්පච්චියි නම් කියන්නේ, ඉගෙනගන්න එකත් එක්ක තමයි ළමයි ලොකු වෙන්නේ කියලා. ඒක නම් ඇත්ත ම තමයි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය භික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01